*සැ. යු.*- 2020.11.27 දින අංක 2204 දරන ගැසට් පත්‍රයේ I:II, II, III, IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,205 - 2020 දෙසැම්බර් මස 04 වැනි සිකුරාදා - 2020.12.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2034 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2049 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 දෙසැම්බර් මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 දෙසැම්බර් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2031 B 82083 — 5,403 (2020/11)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන ශ්‍රේණියට නිලධාරීන් සීමිත පදනම මත බඳවා ගැනීම - 2020

දිවයින පුරා පිහිටි රාජ්‍ය ආයතනවල ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන ශ්‍රේණියේ සිවිල්, යාන්ත්‍රික, දුම්රිය දෙපාර්තමේන්තුවේ විදුලි (බැර) හා විදුලි (ලුහු) ඉංජිනේරු කාණ්ඩවලට අයත් තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා සීමිත පදනම යටතේ සුදුස්සන් තෝරා ගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් ඉංජිනේරු සහකාරවරයකු (කලින් කාර්මික සහකාර) හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක් දරන නිලධාරියකු හෝ අනෙකුත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් පත්වීම් බලධාරියා විසින් අනුමත කරනු ලැබූ සුදුසුකම්ලත් කාර්මික නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ආයතන ප්‍රධානීන් මගින්, ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

කවරයේ වම්පස උඩ කෙළවරේ "ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම (සීමිත) -2020"යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2021.01.04 දින වේ. (මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.)

**සටහන** .- ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි පිළිබඳ සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය. එමෙන්ම සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

සීමිත පදනම මත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට නිලධාරීන් බඳවා ගැනීම මගින් සම්පූර්ණ කළ යුතු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු ගණන 69ක් වන අතර එය පහත දක්වා ඇති කාණ්ඩ යටතේ බෙදී යනු ඇත.

| *කාණ්ඩය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| සිවිල් 01 කාණ්ඩය | 14 |
| සිවිල් 03 (වාරිමාර්ග) කාණ්ඩය | 13 |
| සිවිල් 03 (වාරිමාර්ග නොවන) කාණ්ඩය | 2 |
| සිවිල් 04 කාණ්ඩය | 2 |
| සිවිල් 05 කාණ්ඩය | 2 |
| සිවිල් 06 කාණ්ඩය | 10 |
| සිවිල් 07 කාණ්ඩය | 13 |
| යාන්ත්‍රික 01 කාණ්ඩය | 5 |
| යාන්ත්‍රික 02 කාණ්ඩය | 4 |
| යාන්ත්‍රික 03 කාණ්ඩය | 1 |
| යාන්ත්‍රික 04 කාණ්ඩය | 1 |
| විදුලි 01 කාණ්ඩය | 2 |
| එකතුව | 69 |

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

1.1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු ලබා දීමේ පටිපාටිය අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ජ්‍යෙෂ්ඨතාවයට හා කුසලතාවයට ලබා දෙනු ලබන ලකුණු පිළිවෙල පදනම් කරගෙන තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

1.2. සීමිත බඳවා ගැනීම් යටතේ පත්වීමේ ලිපියක් මගින් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගනු ලබන අවස්ථාවේදී ඔවුන්ගේ සේවා කාණ්ඩයන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1836/6 හා 2013.11.11 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ උපලේඛන I හි දැක්වෙන පරිදි තීරණය කරනු ලැබේ.

1.3. නිලධාරියා අයදුම්පත යොමු කරන අවස්ථාවේ සේවය කරන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව /පළාත් පාලන ආයතනය අයත් වන කාණ්ඩය ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට බඳවා ගැනීමේදී අදාළ කරගනු ලබන කාණ්ඩය ලෙස සලකනු ලබයි.

1.4. පත්වීම ක්‍රියාත්මක වන දිනය හා පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

2.1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1836/6 හා 2013.11.11 දිනැති අති විශේෂ *ගැසට්*

පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් සිදු කර ඇත්තා වූද මින් මතු සිදු කරනු ලැබිය හැකි වූද සංශෝධනවලට ද රාජ්‍ය සේවයේ පත්කිරීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2. මෙම තනතුර ස්ථිරය. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු වේ.

2.3. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර එකක (01) වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

2.4. එහෙත් වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

2.5. මෙම පත්වීම භාරගත් දින සිට වර්ෂ තුනක් (03) ඉකුත් වීමට පෙර, රජයේ ප්‍රතිපත්තිවලට අනුරූපව රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත් බව ඔබ විසින් සනාථ කළ යුතුවේ. ඔබ මෙම පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූයේ සිංහල භාෂාවෙන් නම් ඔබගේ අනෙක් රාජ්‍ය භාෂාව වනුයේ දෙමළ භාෂාව වේ. එසේම ඔබ මෙම පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූයේ දෙමළ භාෂාවෙන් නම් ඔබගේ අනෙක් රාජ්‍ය භාෂාව වනුයේ සිංහල භාෂාව වේ. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන හා ඊට ආනුශංගික වන චක්‍රලේඛවල විධිවිධාන මෙයට අදාළ වේ.

2.6. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

2.7. පත්වීම්ලාභීන්, දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා වාර්තා කළ යුතුය.

2.8. පත්වීම්ලාභීන් රාජ්‍ය සේවයේ මෙන්ම පළාත් රාජ්‍ය සේවයේ ද සේවය කිරීමට යටත් වේ.

3. වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2016 වැටුප් කාණ්ඩය අනුව මෙම තනතුරට රු.47,615 - 10 x1,335 - 8 x1,630 -17 x 2,170-රු. 110,895/= ක මාසික වැටුප් පරිමාණය හිමි වේ.

4. *සුදුසුකම් :*

සුදුසුකම් සපුරා තිබිය යුතු බවට *ගැසට්* නිවේදනයේ සඳහන් දිනට, අයදුම් කරන ලද කාණ්ඩය අනුව පහත සඳහන් මූලික සුදුසුකම්වලින් එකක් සපුරා තිබිය යුතු වන අතර මෙහි 4.2 වගන්තිය යටතේ සඳහන් කර ඇති කොන්දේසි හා නියමයන් ද සපුරා තිබිය යුතුය.

4.1. *මූලික සුදුසුකම් :*

4.1.1. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිලධාරියෙකු ලෙස වසර 15 කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස් වීම් ලැබ සේවය කර තිබීම සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය සම්පූර්ණයෙන් සමත් වීම.

4.1.2. දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියෙකු එම දෙපාර්තමේන්තුවේ වසර 15 කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස් වීම් ලැබ සේවය කර තිබීම.

4.1.3. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු ලෙස වසර 15 කට නොඅඩු සේවා කාලයක් සහිතව ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස් වීම් ලැබ සේවය කර තිබීම සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන රජයේ කාර්මික නිලධාරීන් සඳහා වන තුන්වන විභාගය (1979 ව්‍යවස්ථාව) සම්පූර්ණයෙන් සමත් වීම.

4.1.4. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු ලෙස වසර 21 කට නොඅඩු සේවා කාලයක් සහිතව එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කර තිබීම සහ එම සේවයේ I ශ්‍රේණියේ වසර 05 ක් සේවය කර තිබීම සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන රජයේ කාර්මික නිලධාරීන් සඳහා වන දෙවන විභාගය (1979 ව්‍යවස්ථාව) සම්පූර්ණයෙන් සමත් වීම.

4.1.5 (අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු ලෙස වසර 15කට නොඅඩු සේවා කාලයක් සහිතව එම සේවයේ I ශ්‍රේණියට උසස් කර තිබීම;

හා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක, එම කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති බඳවා ගනු ලබන විෂයධාරාවක් යටතේ වසර 04ක පූර්ණ කාලීන විද්‍යාවේදී ඉංජිනේරු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම;

හෝ

(ආ) 4.1.5 (අ) හි දැක්වෙන උපාධි පාඨමාලාවට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබූ අධ්‍යයන හා අනෙකුත් සියලු අවශ්‍යතා බඳවා ගනු ලබන විෂය ධාරාවක් යටතේ සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතිකය ලබා තිබීම.

4.1.6. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු ලෙස වසර 21කට නොඅඩු (I ශ්‍රේණියේ වසර 05ක සේවා කාලයක්ද ඇතුළුව) සේවා කාලයක් සහිතව එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කර තිබීම හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත ජාතික තාක්ෂණික විද්‍යා ඩිප්ලෝමා විභාගය (NDT) සම්පූර්ණයෙන්ම සමත් වී තිබීම.

4.2. *කොන්දේසි හා නියමයන්* :

4.2.1. තම අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේදී නිලධාරියා රාජ්‍ය සේවය / පළාත් රාජ්‍ය සේවය තුළ සේවයේ නිරත වී සිටිය යුතුයි.

4.2.2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පත්වීම ක්‍රියාත්මක කිරීමට නියමිත දිනය වන විට කිසියම් පත්වීම්ලාභියෙකු රාජ්‍ය සේවයෙන් / පළාත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වීමට කටයුතු කර නොතිබිය යුතුය.

4.2.3. වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුළ පුරප්පාඩු වන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම් කිරීමේදී එම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර නිලධාරියෙකු ලෙස අඛණ්ඩව සේවයේ යෙදී සිටීම අනිවාර්ය වේ.

4.2.4. දුම්රිය දෙපාර්තමේන්තුව තුළ පුරප්පාඩු වන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම් කිරීමේදී එම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක් දරන නිලධාරියෙකු ලෙස අඛණ්ඩව සේවයේ යෙදී සිටීම අනිවාර්ය වේ.

4.2.5. අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් ඒ4 ප්‍රමාණයේ කඩදාසියක සකස්කළ යුතුය. සම්පූර්ණ අයදුම්පත අයදුම්කරුගේ අත්අකුරින් සකස් කර හෝ මුද්‍රිත හිස් අයදුම්පතක ඉල්ලා ඇති තොරතුරු අයදුම්කරුගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

4.2.6 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ.

4.2.7 ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

5. *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

6. *වෙනත් සුදුසුකම්* :

6.1. අයදුම්පත් භාරගනු ලබන අවසන් දින වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන් හා ඊට සිදු කරනු ලැබූ සංශෝධනයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

6.2. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් හා කොන්දේසි සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. *ලකුණු ලබා දීමේ පටිපාටිය* (සම්මුඛ පරීක්ෂණයේදී ලබා දෙන මුළු ලකුණු සංඛ්‍යාව 100 වේ) :

| *අනු අංකය* | *විෂයය* |
|---|---|
| 01 | **සේවා පළපුරුද්ද (උපරිම ලකුණු 60)**<br><br>සුදුසුකම්ලත්, බර තබන ලද සේවා පළපුරුද්ද වැඩිම අයදුම්කරුට ලකුණු 60 ක් ලබා දී සෙසු අයදුම්කරුවන්ට ඔවුන්ගේ බර තබන ලද සේවා පළපුරුද්දට සමානුපාතිකව අඩු වන සේ ලකුණු ලබා දෙනු ලැබේ.<br>සේවා පළපුරුද්ද සඳහා ලකුණු ලබා දීමේ දී සේවා පළපුරුද්දට අදාළ මූලික සුදුසුකම් (අනිවාර්ය සේවා කාලය) සම්පූර්ණ කළ දින සිට අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය දක්වා සේවා කාලය පදනම් කරගනු ලැබේ.<br>[බර තැබූ සේවා පළපුරුද්ද = I පන්තියේ සක්‍රීය සේවා කාලය + (විශේෂ පන්තියේ සක්‍රීය සේවා කාලය x 1.25)] |
| 02 | **කාර්මික දැනුම (උපරිම ලකුණු 20)**<br><br>සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පත් කර ඇති සිවිල්, යාන්ත්‍රික හා විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි විශේෂ දැනුමින් යුත් නිලධාරීන් විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයක් මඟින්, අදාළ ක්ෂේත්‍රයන්හි අයදුම්කරුවන්ගේ ඇති,ප්‍රායෝගික දැනුම හා මූලධර්ම පිළිබඳ ඇති දැනුම පරීක්ෂා කරනු ලබන අතර ප්‍රායෝගික දැනුම සඳහා ලකුණු 10 ක්ද මූලධර්ම පිළිබඳ ඇති දැනුම සඳහා ලකුණු 10 ක්ද බැගින් උපරිම ලකුණු 20ක් ලබා දෙනු ලැබේ. |
| 03 | **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් (උපරිම ලකුණු 10)**<br><br><u>පරිගණක දැනුම (උපරිම ලකුණු 05)</u><br>මාස 06කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර ඇත්නම් උපරිම ලකුණු 05 ක් ලබා දෙනු ලැබේ.<br>මාස 03කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත රජය පිළිගත් ආයතනයකින් ලබා ගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හෝ ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර ඇත්නම් ලකුණු 03 ක් ලබා දෙනු ලැබේ.<br>(උපරිම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. එක් නිලධාරියෙකු සහතික පත්‍ර 02 ක් හෝ වැඩි ගණනක් ඉදිරිපත් කර ඇත්නම් ඉහළම සුදුසුකම සහිත එක් සහතික පත්‍රයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)<br><u>ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය (උපරිම ලකුණු 05)</u><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක් සාර්ථකව නිම කර ඇත්නම් උපරිම ලකුණු 05 ක් ලබා දෙනු ලැබේ.<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කර ඇත්නම් ලකුණු 03 ක් ලබා දෙනු ලැබේ.<br>(උපරිම එක් සුදුසුකමකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. එක් නිලධාරියෙකු සහතික පත්‍ර 02 ක් හෝ වැඩි ගණනක් ඉදිරිපත් කර ඇත්නම් ඉහළම සුදුසුකම සහිත එක් සහතික පත්‍රයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) |
| 04 | **සේවා වාර්තා (උපරිම ලකුණු 05)**<br>(a) <u>කාර්යසාධනය (උපරිම ලකුණු 03)</u><br>පූර්වාසන්න වර්ෂ 03ක කාර්ය සාධනය සඳහා ලකුණු ලබා දේ.<br>"ඉතා හොඳයි" ලෙස සටහන් කර ඇත්නම් එක් වර්ෂයකට - ලකුණු 01 බැගින්<br>"හොඳයි" ලෙස සටහන් කර ඇත්නම් එක් වර්ෂයකට - ලකුණු 0.5 බැගින්<br>(b) <u>ප්‍රශංසා (උපරිම ලකුණු 02)</u><br>අයදුම්කරු ලබා ඇති ප්‍රශංසා සඳහා එක් ප්‍රශංසාවකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 02 දක්වා ලබා දෙනු ලැබේ. (පොදු 230 ආකෘති පත්‍ර මගින් සනාථ කළ යුතුය. සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනට පෙර ලබා ඇති ප්‍රශංසා සඳහා පමණක් ලකුණු ලබා දේ.) |
| 05 | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය (උපරිම ලකුණු 05)** |

*සැලකිය යුතුයි* :

- අපේක්ෂකයෙකු විසින් සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේදී අදාල සහතික හා ලේඛන ඉදිරිපත් කල යුතු අතර එම සියලු ලේඛන / සහතික සැම අතින්ම වලංගු ඒවා විය යුතුය. නිසි බලධාරියාගේ ආවරණ අනුමැතියට යටත්ව ඉදිරිපත් කරනු ලබන කිසිදු ලේඛනයක් / සහතිකයක් වලංගු නොවේ.

- අපේක්ෂකයන් කිහිප දෙනෙකු සමාන ලකුණු ලබා ඇත්නම් එවැනි අවස්ථාවල සුදුසු තීරණයක් ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

- සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

8. *අනන්‍යතාවය* :

අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍ර
- වලංගු රියදුරු බලපත්‍රය

9. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

10. මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

11. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ.ජේ.රත්නසිරි<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2020 නොවැම්බර් මස 30 වැනි දින,<br>
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,<br>
නිදහස් චතුරශ්‍රය,<br>
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සීමිත - 2020**

**Limited Recruitment of Engineers to the Grade III of the Sri Lanka Engineering Service - 2020**

1) අයදුම් කරන කාණ්ඩය :————.
(එක් නිලධාරියෙකුට එක් කාණ්ඩයකට පමණක් ඉල්ලුම් කළ හැක)

2) සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

3) අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :————.
(උදා: GUNAWARDHANA, H.M.S.K.)

4) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

5) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

6) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

7) දැනට සේවය කරන ස්ථානය (අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව/ පළාත් පාලන ආයතනය) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

8) ඉංජිනේරු ක්ෂේත්‍රය {සිවිල්/ යාන්ත්‍රික/ විදුලි (ලුහු සහ බැර)} :————.

9) කාර්යාලීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

10) ස්ත්‍රී පුරුෂ බව :————.

11) විවාහක / අවිවාහක බව :————.

12) ජාතික හැඳුනුම්පත් අංකය :————.

13) උපන් දිනය ඃ වර්ෂය :————. මාසය :————. දිනය :————.

14) අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට වයස ඃ අවුරුදු :————. මාස :————. දින :————.

15) දුරකථන අංකය ඃ ස්ථාවර :————. ජංගම :————.

16) තැපැල් නගරය :————.

17) විද්‍යුත් තැපැල :————.

18) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරියකු/ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සේවයේ නිලධාරියකු/ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියකු (කලින් මධ්‍යම මට්ටමේ කාර්මික සේවය) ලෙස රාජ්‍ය සේවයට බැඳුණු දිනය :————.

19) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරියකු/ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සේවයේ නිලධාරියකු/ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියකු (කලින් මධ්‍යම මට්ටමේ කාර්මික සේවය) ලෙස රාජ්‍ය සේවයේ පත්වීම ස්ථිර කරනු ලැබූ දිනය :————.

20) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරියකු/ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සේවයේ නිලධාරියකු/ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියකු (කලින් මධ්‍යම මට්ටමේ කාර්මික සේවය) ලෙස රාජ්‍ය සේවයට බැඳුණු ස්ථානය (අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව/ පළාත් පාලන ආයතනය) :————.

21) දැනට සිටින සේවය :————.

22) දැනට සිටින පන්තිය/ ශ්‍රේණිය :————.

23) එක් එක් පන්තියට/ ශ්‍රේණියට පත්වීම් ලද/ උසස් වීම් ලද/ අන්තර්ග්‍රහණය කරන ලද දින සහිතව සේවය කරන ලද කාලසීමාවන් අනුපිළිවෙලින් (වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් එය ද ඇතුළත් කළ යුතුය) ඃ

| සේවයේ නම | පන්තිය/ ශ්‍රේණිය | කාල පරාසය | *සේවා කාලය |
|---|---|---|---|
| | | දින සිට දින දක්වා | අවු මාස දින |
| | | | |
| | | | |
| | | | |

*අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට අදාළ ලිපිලේඛන සත්‍ය පිටපතක් බවට සහතික කර අමුණා එවිය යුතුය.

24) අංක 1836/6 හා 2013.11.11 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ 7.3.1.2 වගන්තියට අනුව අවම සුදුසුකම් සපුරාලනුයේ (අදාළ කොටුවෙහි x සලකුණ යොදන්න. ප්‍රතිඵල ලේඛන සත්‍ය පිටපත් බවට සහතික කර අමුණා එවිය යුතුය) ඃ

i. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිලධාරියකු ලෙස වසර 15කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ සේවය කර තිබීම හා විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය සම්පූර්ණයෙන් සමත් වීම.

☐

ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය සම්පූර්ණයෙන් සමත් වූ දිනය ඃ ................................

ආකෘති පත්‍ර 01 සම්පූර්ණ කල යුතුයි.

ii. දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියකු, එම දෙපාර්තමේන්තුවේ වසර 15කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ සේවය කර තිබීම.

☐

iii. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියකු ලෙස වසර 15කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ සේවය කර තිබීම සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන රජයේ කාර්මික නිලධාරීන් සඳහා වන තුන්වන විභාගය (1979 ව්‍යවස්ථාව) සම්පූර්ණයෙන් සමත් වීම.

☐

| විභාගය (1979 ව්‍යවස්ථාව) | ක්ෂේත්‍රය (සිවිල්/ යාන්ත්‍රික) | සුදුසුකම් සාර්ථකව සම්පූර්ණ කරන ලද දිනය** |
|---|---|---|
| 1 වන විභාගය | | |
| 2 වන විභාගය | | |
| 3 වන විභාගය | | |

** ආකෘති පත්‍ර 02,03,04 / ආකෘති පත්‍ර 05 සම්පූර්ණ කල යුතුයි.

iv. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියකු ලෙස වසර 21කට නොඅඩු සේවා කාලයක් සහිතව, එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කර තිබීම හා එම සේවයේ I ශ්‍රේණියේ වසර 05ක් සේවය කර තිබීම සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන රජයේ කාර්මික නිලධාරීන් සඳහා වන දෙවන විභාගය (1979 ව්‍යවස්ථාව) සම්පූර්ණයෙන් සමත් වීම.

☐

| විභාගය (1979 ව්‍යවස්ථාව) | ක්ෂේත්‍රය (සිවිල්/ යාන්ත්‍රික) | සුදුසුකම් සාර්ථකව සම්පූර්ණ කරන ලද දිනය*** |
|---|---|---|
| 1 වන විභාගය | | |
| 2 වන විභාගය | | |

*** ආකෘති පත්‍ර 02,03 / ආකෘති පත්‍ර 05 සම්පූර්ණ කල යුතුයි.

v. (අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියකු ලෙස වසර 15කට නොඅඩු සේවා කාලයක් සහිතව එම සේවයේ I ශ්‍රේණියට උසස් කර තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක, එම කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති බඳවා ගනු ලබන විෂය ධාරාවක් යටතේ වසර 04ක පූර්ණ කාලීන විද්‍යාවේදී ඉංජිනේරු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.;

හෝ

(ආ) v. (අ) හි දැක්වෙන උපාධි පාඨමාලාවට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබූ අධ්‍යයන හා අනෙකුත් සියලු අවශ්‍යතා බඳවා ගනු ලබන විෂය ධාරාවක් යටතේ සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතිකය ලබා තිබීම. (අදාළ සහතික පත්‍රවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතුය).

☐

vi. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියකු ලෙස වසර 21කට නොඅඩු (I ශ්‍රේණියේ වසර 05ක සේවා කාලයක්ද ඇතුළුව) සේවා කාලයක් සහිතව එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කර තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත ජාතික තාක්ෂණික විද්‍යා ඩිප්ලෝමා විභාගය (NDT) සම්පූර්ණයෙන්ම සමත් වී තිබීම. (අදාළ සහතික පත්‍රවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතුය).

☐

25) අයදුම්කරුගේ සතුටුදායක සේවා කාලය ෴

(අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව පූර්වාසන්න වසර 05ක කාර්යසාධන වාර්තාද ඇතුළත්ව අදාළ අනෙකුත් ලිපිලේඛනවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතුය)

i. ඔබගේ සේවා කාලය තුළදී විනයානුකූලව දඬුවමකට භාජනය වී ඇත්නම්, වරදේ ස්වභාවය, දී ඇති දඬුවම හා දඬුවම දුන් දිනය සඳහන් කරන්න :————.

ii. පසුගිය පස් වසරක වැටුප් වර්ධක ලබා ඇත් ද යන වග :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හා වැරදි සහගත බව පත්වීම් ලබා දීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුරට නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව පත් කිරීම අවලංගු කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

දැනට මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරී/ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සේවයේ නිලධාරී/ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (කලින් මධ්‍යම මට්ටමේ කාර්මික සේවය) ........................................................ මහතා/ මහත්මිය/ මෙනවිය ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති අතර, එම නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද මෙම අයදුම්පත සුදුසු කටයුතු සඳහා ඉදිරිපත් කරමි. තවද, ඔහුට/ ඇයට විරුද්ධව විනයානුකූල කටයුත්තක් අරඹා ඇති/ නැති බවත්, ඉදිරියේදී එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට කරුණු ඉදිරිපත් වී ඇති/ නැති බවත් සහතික කරමි. (අනවශ්‍ය වචන කපා හරින්න).

අයදුම්පත විධිමත් පරිදි නිලධාරියා විසින් භාර දුන් දිනය :————.

————.
අත්සන හා නිල මුද්‍රාව (ලේකම්/ ප්‍රධාන ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානී)

දිනය :————.

ආකෘති පත්‍ර 01.

**ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

නම : ......................................................................................

ප්‍රායෝගික පරීක්ෂණය

| *විෂයය* | | *ලකුණු* | | | |
|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| I වන භාගය | | | | | |
| I වන කාණ්ඩය | මට්ටම් ගැනීම (ප්‍රායෝගික පරීක්ෂණය) (>50%) | | | | |
| II වන කාණ්ඩය | මිණුම් (බිම් මැනුව) (ප්‍රායෝගික පරීක්ෂණය) (>50%) | | | | |

ලිඛිත පරීක්ෂණය

| *විෂයය* | | *ලකුණු* | | | |
|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| I වන භාගය | | | | | |
| III වන කාණ්ඩය | (අ) ව්‍යුහවාදය (ව්‍යුහ හා ද්‍රව්‍යවල ප්‍රභලතාවය පිළිබඳ සිද්ධාන්ත) | | | | |
| | (ආ) ද්‍රාව විද්‍යාව | | | | |
| II වන කාණ්ඩය | මිණුම් (බිම් මැනුව) (ප්‍රායෝගික පරීක්ෂණය) (>50%) | | | | |
| II වන භාගය | | | | | |
| I වන කාණ්ඩය | (අ) සැලසුම්, ඇඳීම හා සම්මත පිරිවිතර | | | | |
| | (ආ) වාරිමාර්ග | | | | |
| II වන කාණ්ඩය | (අ)ප්‍රමාණය (ප්‍රමාණ සමීක්ෂණය) | | | | |
| | (ආ) ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු විධිවිධාන | | | | |

ලිඛිත පරීක්ෂණයේ අවම ලකුණු මට්ටම 40%
ලිඛිත පරීක්ෂණවල ලකුණු සාමාන්‍ය (>50%) : ..................................

*සටහන* : I වන භාගයේ I වන කාණ්ඩයෙන් හා II වන කාණ්ඩයෙන් සමත්වීමට අපේක්ෂකයන් එම එක් එක් කාණ්ඩයෙන් 50% අවමයක් ලබා ගත යුතුය. අනෙක් ඕනෑම කාණ්ඩයකින් එක් එක් විෂයයෙන් 40% අවමයක් ලබා ගැනීමෙන් එම විෂයයෙන් සමත් විය හැකි වුව ද, විභාගයෙන් සමත් වීම පිණිස සියලු ලිඛිත පරීක්ෂණ පත් සඳහා 50%කට නොඅඩු සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

04 කට නොවැඩි උත්සහ වාර ගණනකදී සියලුම කාණ්ඩ ඉහත සඳහන් පරිදි සමත් වීමෙන් ජ්‍යෝෂ්ඨ කාර්මික විභාගය සමත් විය යුතුය.

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

ආකෘති පත්‍ර 02.

**රාජ්‍ය සේවා කාර්මික නිලධාරීන් සඳහා පවත්වනු ලබන විභාග (සිවිල්/ යාන්ත්‍රික)**
**1979 ව්‍යවස්ථාව - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

නම : ..........................................................................................

**1 වන පරීක්ෂණය (සිවිල්)**

*අනිවාර්යය විෂයයන් :*

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| ලිඛිත පරීක්ෂණය | | | | | | | |
| මිණුම් ප්‍රායෝගික | | | | | | | |
| මට්ටම් ගැනීම ප්‍රායෝගික | | | | | | | |
| මැනීම් හා මට්ටම් ගැනීම (පහළ පත්‍රය) | 03 | | | | | | |

*විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු :* ...............

(මිනුම් හා මට්ටම් ගැනීම විෂයයේ සාමාර්ථයන් තීරණය කිරීමේදී, ඉහත දක්වා ඇති කොටස් 03න් සෑම කොටසක් සඳහා ම 35%ක අවම ලකුණු ප්‍රමාණයක් ලැබිය යුතු අතර සම්පූර්ණ විෂයයෙන් සමත් වීම සඳහා කොටස් 03න්ම 40% සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ලද යුතුය.)

| *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| ගණිතය (පහළ පත්‍රය) | 01 | | | | | | |
| ප්‍රමාණ ගැනීම (පහළ පත්‍රය) | 02 | | | | | | |
| සැලසුම් ඇඳීම හා පිටපත් කිරීම | 04 | | | | | | |

*වෛකල්පිත විෂයයන් :* පහත දැක්වෙන විෂයන්ගෙන් 02ක් සමත් විය යුතුයි.

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය ………* | *වර්ෂය ………* | *වර්ෂය ………* | *වර්ෂය ………* | *වර්ෂය ………* | *වර්ෂය ………* |
| මූලික ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තුව | 05 | | | | | | |
| ජල සම්පාදනය හා ජලාපවහනය | 06 | | | | | | |
| වැඩ බිම් පාලනය | 07 | | | | | | |
| පාරවල් තැනීම හා නඩත්තුව | 08 | | | | | | |
| | | | | | | | |

*විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු:* ..........................

(සම්පූර්ණ විභාගයෙන් සමත් වීම සඳහා එක් විෂයයකට 40%ක අවමයක් ලබා ගත යුතු අතර අදාළ සියලු විෂයයන්ගෙන් ලබන ලකුණුවල එකතුවේ සාමාන්‍ය ගණන 45% විය යුතුය.)

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

ආකෘති පත්‍ර 03

**2 වන පරීක්ෂණය (සිවිල්)**

*අනිවාර්යය විෂයන් :*

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය ………* | *වර්ෂය ………* | *වර්ෂය ………* | *වර්ෂය ………* | *වර්ෂය ………* | *වර්ෂය ………* |
| ලිඛිත පරීක්ෂණය | | | | | | | |
| මිණුම් ප්‍රායෝගික | | | | | | | |
| මට්ටම් ගැනීම ප්‍රායෝගික | | | | | | | |
| මැනීම් හා මට්ටම් ගැනීම | 23 | | | | | | |

*විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු :* ...............

(මිනුම් හා මට්ටම් ගැනීම විෂයේ සාමාර්ථයන් තීරණය කිරීමේදී, ඉහත දක්වා ඇති කොටස් 03න් සෑම කොටසක් සඳහා ම 35%ක අවම ලකුණු ප්‍රමාණයක් ලැබිය යුතු අතර සම්පූර්ණ විෂයෙන් සමත් වීම සඳහා කොටස් 03 න්ම 40% සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ලද යුතුය.)

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| ගණිතය (ඉහළ පත්‍රය) | 21 | | | | | | |
| ප්‍රමාණ ගැනීම (ඉහළ පත්‍රය) | 22 | | | | | | |
| ඇඳීම | 24 | | | | | | |

**වෛකල්පිත විෂයන්** : පහත දැක්වෙන විෂයන්ගෙන් 03ක් සමත් විය යුතුයි.

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| ගොඩනැගිලි ඉදිකිරීම (ඉහළ පත්‍රය) | 25 | | | | | | |
| ජල සම්පාදනය හා ජලාපවහනය | 26 | | | | | | |
| පාරවල් තැනීම හා නඩත්තුව | 27 | | | | | | |
| පාලම් හා විශාල ආකෘති තැනීම හා නඩත්තුව | 28 | | | | | | |
| වැඩ සංවිධාන | 29 | | | | | | |

*විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු :* ..........................

(සම්පූර්ණ විභාගයෙන් සමත් වීම සඳහා එක් විෂයකට 40%ක අවමයක් ලබා ගත යුතු අතර අදාළ සියලු විෂයන්ගෙන් ලබන ලකුණුවල එකතුවේ සාමාන්‍ය ගණන 45% විය යුතුය.)

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

ආකෘති පත්‍ර 04

**3 වන පරීක්ෂණය (සිවිල්)**

*අනිවාර්යය විෂයන් :*

| *විෂය* | *විෂයය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| ලිඛිත පරීක්ෂණය | | | | | | | |
| මිණුම් ප්‍රායෝගික | | | | | | | |
| මට්ටම් ගැනීම ප්‍රායෝගික | | | | | | | |
| මැනීම් හා මට්ටම් ගැනීම | 48 | | | | | | |

*විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු :* ..............

(මිනුම් හා මට්ටම් ගැනීම විෂයේ සාමාර්ථයන් තීරණය කිරීමේදී, ඉහත දක්වා ඇති කොටස් 03න් සෑම කොටසක් සඳහා ම 35%ක අවම ලකුණු ප්‍රමාණයක් ලැබිය යුතු අතර සම්පූර්ණ විෂයෙන් සමත් වීම සඳහා කොටස් 03 න්ම 40% සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ලද යුතුය.)

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව I | 41 | | | | | | |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව III | 44 | | | | | | |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව IV | 45 | | | | | | |
| ගොඩනැගිලි ප්‍රමාණ ගැනීම හා ගොඩනැගිලි ඇස්තමේන්තු කිරීම | 46 | | | | | | |
| වාස්තු විද්‍යාත්මක ඇඳීම | 47 | | | | | | |

*වෛකල්පිත විෂයන් :* පහත දැක්වෙන විෂයන්ගෙන් 01ක් සමත් විය යුතුයි.

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව II | 42 | | | | | | |
| පාරවල් තැනීම හා නඩත්තුව | 43 | | | | | | |

*විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු :* ..........................

(සම්පූර්ණ විභාගයෙන් සමත් වීම සඳහා එක් විෂයකට 40%ක අවමයක් ලබා ගත යුතු අතර අදාළ සියළු විෂයන්ගෙන් ලබන ලකුණුවල එකතුවේ සාමාන්‍ය ගණන 45% විය යුතුය.)

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ආකෘති පත්‍ර 05

රාජ්‍ය සේවා කාර්මික නිලධාරින් සඳහා පවත්වනු ලබන විභාග (සිවිල්/ යාන්ත්‍රික)
1979 ව්‍යවස්ථාව - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

නම : ...................................................................................

1 වන පරීක්ෂණය (යාන්ත්‍රික)
සියළුම විෂයන් අනිවාර්ය වේ

| විෂයය | විෂයය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... |
| ගණිතය (පහළ පත්‍රය) | 01 | | | | | | |
| යාන්ත්‍රික ප්‍රමාණය | 09 | | | | | | |
| යාන්ත්‍රික ඇඳීම හා පිටපත් කිරීම | 10 | | | | | | |
| වැඩපල පුහුණුව | 11 | | | | | | |
| ප්‍රායෝගික වැඩ (වැද්දුම් වැඩකම්හල්) ආදිය | 12 | | | | | | |
| මැනීම හා මට්ටම් ගැනීම (ප්‍රායෝගික) | 13 | | | | | | |

විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු : ..........................

(සම්පූර්ණ විභාගයෙන් සමත් වීම සඳහා එක් විෂයකට 40%ක අවමයක් ලබා ගත යුතු අතර අදාළ සියළු විෂයන්ගෙන් ලබන ලකුණුවල එකතුවේ සාමාන්‍ය ගණන 45% විය යුතුය.)

2 වන පරීක්ෂණය (යාන්ත්‍රික)
සියළුම විෂයන් අනිවාර්ය වේ

| විෂයය | විෂයය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... |
| ගණිතය (ඉහළ පත්‍රය) | 21 | | | | | | |
| යාන්ත්‍රික ප්‍රමාණ ගැනීම (උසස් පත්‍රය) | 30 | | | | | | |

| විෂයය | විෂයය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... |
| යාන්ත්‍රික ඇඳීම හා පිටපත් කිරීම (ඉහළ පත්‍රය) | 31 | | | | | | |
| කර්මාන්තශාලා පුහුණුව | 32 | | | | | | |

*විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු :* ..........................

(සම්පූර්ණ විභාගයෙන් සමත් වීම සඳහා එක් විෂයකට 40%ක අවමයක් ලබා ගත යුතු අතර අදාළ සියළු විෂයන්ගෙන් ලබන ලකුණුවල එකතුවේ සාමාන්‍ය ගණන 45% විය යුතුය.)

3 වන පරීක්ෂණය (යාන්ත්‍රික)
සියළුම විෂයන් අනිවාර්ය වේ

| විෂයය | විෂයය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... |
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව I | 49 | | | | | | |
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව II | 50 | | | | | | |
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව III | 51 | | | | | | |
| ඉංජිනේරු ආර්ථික විද්‍යාව | 52 | | | | | | |
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව - ඇඳීම | 53 | | | | | | |

විභාගය සමත් වීම සඳහා සාමාන්‍ය ලකුණු : ..........................

(සම්පූර්ණ විභාගයෙන් සමත් වීම සඳහා එක් විෂයකට 40%ක අවමයක් ලබා ගත යුතු අතර අදාළ සියළු විෂයන්ගෙන් ලබන ලකුණුවල එකතුවේ සාමාන්‍ය ගණන 45% විය යුතුය.)

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-228

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ඉඩම් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මැනුම් ක්ෂේත්‍ර සහයකයින් සඳහා වූ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම - 2 (NVQ Level 2) පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම - 2021**

01. මැනුම් ක්ෂේත්‍ර සහයකයින් සඳහා වන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම - 2 (NVQ Level - 2) පාඨමාලාව සඳහා පහත සුදුසුකම් සපුරාලන ලද අපේක්ෂකයින් අතරින් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

(අ) මනා චරිතයකින් යුක්ත විය යුතුය.
(ආ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ඇ) වයස අවුරුදු 18ත් 45ත් අතර විය යුතුය.
(ඈ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථයන් දෙකක් සහිතව විෂයයන් හයකින් සමත් විය යුතුය. අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

02. සෑම අයදුම්කරුවෙකුම මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව 11.7" x 8.3" (A4) ප්‍රමාණයේ කඩදාසියක අදාළ අයදුම්පත්‍රය සකස් කර තම අත් අකුරින්ම සියලු තොරතුරු සම්පූර්ණ කර සුපුරුදු අත්සන යෙදිය යුතුය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක බහා එම කවරයේ ඉහළ වම් කෙළවරෙහි ඉල්ලුම් කරන පාඨමාලාවේ නම ''NVQ Level -2 : 2021'' ලෙස සඳහන් කොට 2020.12.28 දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අධ්‍යක්ෂ,
මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය,
දියතලාව.

03. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. (අ) මෙම පාඨමාලාව සිංහල/දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.
(ආ) පාඨමාලාව සඳහා සුදුස්සන් තෝරා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි. එහිදී අයදුම්කරුවන් විසින් ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත අවශ්‍ය සිසුන් තෝරා ගැනේ. පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන සිසුන්ගේ නාම ලේඛනය ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙහි (www.survey.gov.lk) ප්‍රසිද්ධ කරනු ලැබේ.
(ඇ) පාඨමාලාව හදාරන කාලය තුළදී පුහුණුලාභීන්ට කිසිදු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

05. පාඨමාලාවේ මුළු කාලය සති 12 කි. එය පහත දක්වා ඇති පරිදි මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ සති 2ක පූර්ණ කාලීන නේවාසික පාඨමාලාවකින්ද, ක්ෂේත්‍රයේ සති 10ක ප්‍රායෝගික පුහුණුවකින්ද යුක්ත වේ. මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ නේවාසික කාලය සඳහා වැයවන වියදම් ලෙස එක් පුහුණුලාභියකුගෙන් රු. 5,000 ක් අයකරනු ලබන අතර තෝරාගත් පුහුණුලාභීන් පාඨමාලාව ආරම්භක දිනයේදීම එම මුදල මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය වෙත ගෙවා රිසිට් පතක් ලබාගත යුතුය.

| අදියර | කාලය | පැවැත්වෙන ස්ථානය | නවාතැන් | ආහාරපාන |
|---|---|---|---|---|
| 1 | සති 2 | ''මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය'' දියතලාව (පූර්ණ කාලීන නේවාසික පාඨමාලාව) | නේවාසික පහසුකම් ලබාදේ | සපයාගත යුතුය. (ආපන ශාලා පහසුකම් ඇත.) |
| 2 | සති 10 | ක්ෂේත්‍රයේ පිහිටි ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයන්ට අනුබද්ධව ප්‍රායෝගික පුහුණුව | සපයාගත යුතුය | සපයා ගත යුතුය. |

06. පුහුණුව අවසානයේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පවත්වනු ලබන ලිඛිත/ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් සිසුන්ගේ දැනුම පරීක්ෂා කර ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම - 2 ට අදාළ සහතිකය නිකුත් කරනු ලැබේ.

07. අසත්‍ය හෝ වංචනික ලේඛන ඉදිරිපත් කර ඇති බව තහවුරු වුවහොත් එම අයදුම්කරුවන් පාඨමාලාව සඳහා නුසුදුස්සන් සේ සලකනු ලැබේ.

08. පුහුණුව අවසන් කළ පසු රැකියාවක් ලබාදීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට කිසිදු වගකීමක් හෝ බැඳීමක් නොමැති අතර, පාඨමාලාව සාර්ථකව සම්පූර්ණකර ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම - 2 (NVQ - 2) සුදුසුකම් ලබා ගන්නා තැනැත්තන්ට මැනුම් ක්ෂෙත්‍ර සහයකයන් බඳවා ගැනීමේ විභාගයක් පවත්වන අවස්ථාවක ඊට අවශ්‍ය වෘත්තීය සුදුසුකම පමණක් මෙමගින් සැපිරේ.

09. පාඨමාලාව සඳහා බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය සර්වේයර් ජනරාල් විසින් තීරණය කරනු ඇත.

ඒ. එල්. ශ්‍යාමලී චිත්‍රලේඛා පෙරේරා,
සර්වේයර් ජනරාල්.

ආදර්ශ අයදුම්පත්‍රය

**මැනුම් ක්ෂෙත්‍ර සහයකයින් පුහුණු කිරීම සඳහා වන ''ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 2 ( NVQ Level 2) පාඨමාලාව - 2021'' සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම :————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

03. ස්ථිර ලිපිනය :————.

04. සම්බන්ධ කරගත හැකි දුරකථන අංක ඃ ස්ථාවර :————. ජංගම :————.

ඊ-මේල් :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————.

06. දිස්ත්‍රික්කය :————.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

07. උපන් දිනය :————. 2020.12.28 වැනි දිනට වයස ඃ
(අවුරුද්ද/මාසය/දිනය) අවුරුදු :————. මාස :————. දින :————.

08. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

09. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල (දෙවරකට නොවැඩි වාර ගණනකදී) :

| *විභාග අංකය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *විභාගයට පෙනී සිටි විෂයයන්* | *ලබාගත් ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටියේ නම් එම ප්‍රතිඵල :

| *විභාග අංකය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *විභාගයට පෙනී සිටි විෂයයන්* | *ලබාගත් ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. මීට පෙර NVQ පාඨමාලාවක් හදරා තිබේනම් එම පාඨමාලාවේ විස්තර :
පාඨමාලාවේ අංකය/සංකේතය :————.

NVQ මට්ටම :————.

ආයතනය :————.

11. අයදුම්කරුගේ ප්‍රකාශය :

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, ඉල්ලුම් කොට ඇති පාඨමාලාවට අවශ්‍ය සුදුසුකම් මා සපුරා ඇති බවත්, මෙයින් සහතික කරමි. තවද මෙම පාඨමාලාව සම්බන්ධ ඇති සියලු නීති රීති වලට අනුව ක්‍රියා කිරීමටද, සර්වේයර් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය ලෙස පිළිගැනීමටද එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-61

සංශෝධනයයි

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව**

අධ්‍යාපන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2019(2020)**

''ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2, 162 හා 2020.02.07 දින දරන *ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද, නිවේදනය අංක 2,199 හා 2020.10.23 දිනැති සහ අංක 2,200 හා 2020.10.29 දිනැති ගැසට් පත්‍ර මගින් සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2019(2020) සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ පහත දැක්වෙන වගන්ති එය ඉදිරියෙන් දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ.''

අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය : 2020.12.18

05. වයස් සීමාව : 2020.11.06 දිනට වයස අවුරුදු 50ට නොවැඩි විය යුතුය.
ඒ අනුව 1970.11.06 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.
(මෙම වයස් සීමාව මෙම අවස්ථාවේ දී පමණක් බලපැවැත් වේ.)

මෙම සංශෝධන හැර ඉහත *ගැසට්පත්‍ර* මගින් දක්වා ඇති අනෙකුත් සියලුම කොන්දේසි නොවෙනස්ව පවතී.

මෙම විභාගය සඳහා ඉහත *ගැසට්පත්‍ර* අනුව අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත් වලංගු වන අතර, එම අයදුම්කරුවන් නැවත මේ සඳහා අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2020 නොවැම්බර් මස 25 වැනි දින.

12-83

---

සංශෝධනයයි

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව**

අධ්‍යාපන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019(2020)**

''ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2, 162 හා 2020.02.07 දින දරන *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද, නිවේදනය අංක 2,199 හා 2020.10.23 දිනැති සහ අංක 2,200 හා 2020.10.29 දිනැති *ගැසට් පත්‍ර* මගින් සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019(2020) සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ පහත දැක්වෙන වගන්ති එය ඉදිරියෙන් දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ.''

අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය : 2020.12.18

4. I (iii) සුදුසුකම් ලබන දිනය - සේවයට පත් කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අංක 04 සිට 06 ඡේදය දක්වා සඳහන් කර ඇති සියලු සුදුසුකම් 2020.03.06 වැනි දින හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

මෙම සංශෝධන හැර ඉහත *ගැසට් පත්‍ර* මගින් දක්වා ඇති අනෙකුත් සියලුම කොන්දේසි නොවෙනස්ව පවතී.

මෙම විභාගය සඳහා ඉහත *ගැසට්පත්‍ර* අනුව අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත් වලංගු වන අතර එම අයදුම්කරුවන් නැවත මේ සඳහා අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2020 නොවැම්බර් මස 25 වැනි දින.

12-84

---

සංශෝධනයයි

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

වී හා ධාන්‍ය, කාබනික පොහොර, ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ලූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරි II ශ්‍රේණියේ නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය 2020

අංක 2,200 - 2020 ඔක්තෝබර් මස 29 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ''ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවිජන සංවර්ධන නිලධාරි II ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය 2020'' විභාග නිවේදනයේ 1 වන ඡේදයේ 1.1 කොටස, දිවයින තුළ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ :

1.1 අයදුම්පත්‍ර කැඳවනු ලබන අවසන් දිනය 2021 ජනවාරි මස 15 වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ.
*විභාග දිනය* : මෙම විභාගය විභාග කොමසාරිස් ජනාරාල් විසින් තීරණය කරනු ලබන දිනයක දී පැවැත්වෙනු ඇත :

02. එම ගැසට් නිවේදනයේ අනිකුත් විධිවිධාන එලෙසින්ම බල පැවැත්වේ.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2020 නොවැම්බර් මස 27 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
තැ. පෙ. 537, කොළඹ 07.

12 - 04/1

---

සංශෝධනයයි

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

වී හා ධාන්‍ය, කාබනික පොහොර, ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ලූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛාණ්ඩ 2 සේවා ගණය (MN-01-2016) යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2020

අංක 2,200 - 2020 ඔක්තෝබර් මස 29 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළකරන ලද ''ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛාණ්ඩ 2 සේවා ගණය (MN-01-2016A)

යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2020'' විභාග නිවේදනයේ 8 වන ඡේදයේ 8.1 කොටස, දිවයින තුළ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

8.1 අයදුම්පත්‍ර කැඳවනු ලබන අවසන් දිනය 2021 ජනවාරි මස 15 වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ.
*විභාග දිනය* : මෙම විභාගය විභාග කොමසාරිස් ජනාරාල් විසින් තීරණය කරනු ලබන දිනයක දී පැවැත්වෙනු ඇත :

02. එම *ගැසට්* නිවේදනයේ අනිකුත් විධිවිධාන එලෙසින්ම බල පැවැත්වේ.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2020 නොවැම්බර් මස 27 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
තැ. පෙ. 537, කොළඹ 07.

12 - 04/3

---

සංශෝධනයයි

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

වී හා ධාන්‍ය, කාබනික පොහොර, ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ලූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බාණ්ඩ 2 සේවා ගණය (MN-01-2016A) යටතේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2020

අංක 2,200 - 2020 ඔක්තෝබර් මස 29 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද'' ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බාණ්ඩ 2 සේවා ගණය (MN-01-2016A) යටතේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධ නිවේදනය සංශෝධනය කිරීම.

02. 8 වන ඡේදයේ 8.1 කොටස පහත පරිදි සංශෝධනය කරනු ලැබේ:

8.1 අයදුම්පත්‍ර කැඳවනු ලබන අවසන් දිනය 2021 ජනවාරි මස 15 වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ.
*විභාග දිනය* : මෙම විභාගය විභාග කොමසාරිස් ජනාරාල් විසින් තීරණය කරනු ලබන දිනයක දී පැවැත්වෙනු ඇත.

03. උක්ත නිවේදනයේ 2 වන ඡේදයේ 2.5 කොටස මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ අංක PE/1/25/2020 සහ 2020.11.19 දිනැති ලිපියෙන් ලබා දුන් උපදෙස්වලට අනුකූල වන ලෙස කටයුතු කරනු ලබනු පිණිස පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

2.5 - සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 06ක කාල සීමාවක් ඇතුළත අයදුම් කරනු ලබන දිස්ත්‍රික්කයේ අවම වශයෙන් වසර තුනක (03) අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබිය යුතු අතර, එය තමා පදිංචියට අදාළ වසමේ ග්‍රාම නිලධාරීවරයා විසින් නිකුත් කරනු ලබන පදිංචිය සහ චරිතය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය (DS4 ආකෘතිය) මගින් සනාථ කළ යුතු ය.

04. එම *ගැසට්* පත්‍රයේ සිංහල නිවේදනයේ අංක 9 ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ:

9. *විභාග ගාස්තු* - අයදුම්කරු විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු රු. 600/-ක මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ ආදායමට බැරවන පරිදි දිවයිනේ ඕනෑම තැපැල් හෝ උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය. විභාග සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොන යම් හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ. මතු ප්‍රයෝජනය සඳහා කුවිතාන්සියේ පිටපතක් ළඟ තබා ගැනීම සුදුසු ය.

05. *ගැසට්* පත්‍රයේ සිංහල ආදර්ශ අයදුම්පතෙහි ''1.1 විභාග ගාස්තු '' යටතේ සඳහන් ''ගෙවන ලද ගොවිජන සේවා මධ්‍යස්ථානය'' යන්න ''ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය'' යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

06. එම *ගැසට්* නිවේදනයේ අනිකුත් විධිවිධාන එලෙසින්ම බල පැවැත්වේ.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2020 නොවැම්බර් මස 27 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
තැ. පෙ. 537, කොළඹ 07.

12 - 04/2

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020

දිවයින පුරා පිහිටි රාජ්‍ය ආයතනවල ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ සිවිල්, යාන්ත්‍රික, විදුලි (බැර හා ලුහු), රසායන සහ භූ සම්පත් යන ඉංජිනේරු කාණ්ඩවලට අයත් තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා සුදුස්සන් තෝරාගැනීමේ විවෘත තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම 2020.12.04 දින පැය 08:00 සිට 2021.01.04 දින පැය 24:00 දක්වා www.slida.lk වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගත ක්‍රමයට (Online) පමණක් සිදුකළ යුතුය.

විවෘත පදනම මත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට නිලධාරීන් බඳවා ගැනීම මගින් සම්පූර්ණ කළ යුතු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු ගණන 221 ක් වන අතර එය පහත දක්වා ඇති කාණ්ඩ යටතේ බෙදී යනු ඇත.

| කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| සිවිල් | 170 |
| යාන්ත්‍රික | 30 |
| විදුලි (බැර හා ලුහු) | 11 |
| භූ සම්පත් | 9 |
| රසායන | 1 |
| **එකතුව** | **221** |

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

1.1. විවෘත බඳවා ගැනීම සඳහා අදාළ විෂය ධාරාවන් යටතේ වෘත්තීය සුදුසුකම්ලත් ඉංජිනේරුවරුන් පමණක් බඳවා ගනු ලැබේ. පත්වීම් ක්‍රියාත්මක වන දිනය සහ පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

1.2. පත්වීම් ලබාදීම සඳහා නිලධාරීන් බඳවා ගැනීම ලිඛිත පරීක්ෂණයේ ලකුණු අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවා තනතුර සඳහා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව සිදුකරනු ලබයි.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

2.1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1836/6 හා 2013.11.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් සිදු කර ඇත්තා වූද මින් මතු සිදු කරනු ලැබිය හැකි වූද සංශෝධනවලට ද රාජ්‍ය සේවයේ පත්කිරීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුවේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

2.3. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

2.4. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධානවලට හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර තුනක් (03) තුළදී ලබා ගත යුතුය. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

2.5. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

2.6. පත්වීම්ලාභීන්, දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා වාර්තා කළ යුතුය.

2.7. පත්වීම්ලාභීන් රාජ්‍ය සේවයේ මෙන්ම පළාත් රාජ්‍ය සේවයේ ද සේවය කිරීමට යටත් වේ.

2.8. තමන් පත් කරනු ලබන තනතුරේ රාජකාරී නියමිත දිනයේ භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින පත්වීම්ලාභීන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

3. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1- 2016, රු.47,615- 10 x 1,335 - 8 x 1,630 -17 x 2,170-110,895/= ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

එසේ වුව ද බඳවා ගනු ලබන අවස්ථාවේ දී පූර්ණ වෘත්තීය සුදුසුකම් (වරලත් ඉංජිනේරු තත්වය) ලබා තිබෙන හෝ බඳවා

ගැනීමෙන් පසු ඉංජිනේරුවරයෙකු පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ගත් විට එම නිලධාරියා සේවයේ III ශ්‍රේණියේ හයවන (06) වැටුප් පියවරේ පිහිටවනු ලැබේ.

4. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* :

4.1. අධ්‍යාපන සුදුසුකම් :

4.1.1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක එම කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති වසර හතරක (04) පූර්ණ කාලීන විද්‍යාවේදී ඉංජිනේරු උපාධි පාඨමාලාවකට බඳවා ගනු ලබන විෂය ධාරාවක් යටතේ සාර්ථකව සම්පූර්ණ කර උපාධිය ලබා තිබිය යුතුය.

හෝ

4.1.2. ඉහත 4.1.1. හි දැක්වෙන උපාධි පාඨමාලාවට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබූ අධ්‍යයන සහ අනෙකුත් සියලු අවශ්‍යතා බඳවාගනු ලබන විෂය ධාරාවක් යටතේ සම්පූර්ණ කර, ඊට අදාළ වලංගු සහතිකය ලබා තිබිය යුතුය.

4.2. වෘත්තීය සුදුසුකම් :

4.2.1. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් අධ්‍යයන අවශ්‍යතා සම්පූර්ණ කර එහි ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් සපුරා තිබෙන බව සනාථ කිරීමට එම ආයතනය විසින් නිකුත් කරනු ලබන වලංගු සහතිකය ලබා තිබිය යුතුය.

5. *වයස් සීමාව* :

5.1. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ 35ට නොවැඩි වීම.

5.2. එසේ වුව ද 2013.11.11 දිනට පෙර සේවයට බැදී ඇති රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ කාර්මික නිලධාරියකුට (එනම් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් ඉංජිනේරු සහකාර වරයකු [කලින් කාර්මික සහකාර] හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක් දරන නිලධාරියකු හෝ අනෙකුත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් පත්වීම් බලධාරියා විසින් අනුමත කරනු ලැබූ සුදුසුකම් ලත් කාර්මික නිලධාරියකුට) උපරිම වයස් සීමාව අවුරුදු 45 වේ.

6. *කායික සුදුසුකම්* :

6.1. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

7. *වෙනත් සුදුසුකම්* :

7.1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

7.2. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

7.3. ඉහත 4 යටතේ දැක්වෙන සුදුසුකම්වලට අදාළ සහතික නිකුත් කිරීමට පාදක කර ගනු ලබන සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛනවල (Academic Transcript) අඩංගු විෂයන් බඳවා ගනු ලබන සේවා කාණ්ඩවල අවශ්‍යතා වලට සෑම අතින්ම අනුකූල විය යුතුය.

7.4. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු අයදුම් කිරීම සඳහා සුදුසුකම් නොලබයි.

7.5. ඉහත අංක 5.2 යටතේ සුදුසුකම් ලබන කාර්මික නිලධාරියකු තම සේවයේ ස්ථිර වී අයදුම්පත් භාර ගනු ලබන අවසන් දින වන විට එම සේවයේ පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය. (පූර්වාසන්න සතුටුදායක සේවා කාලය තීරණය කිරීමේ කාර්යය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන් හා ඊට සිදු කරනු ලැබූ සංශෝධනයන් අදාළ කර ගනු ලැබේ.)

7.6. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට (2021.01.04 දිනට) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සහ කොන්දේසි සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8. *ලිඛිත විභාගය හා සම්මුඛ පරීක්ෂණය* :

8.1. ලිඛිත විභාගය

8.1.1. මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලැබේ.

8.1.2. විෂය නිර්දේශය :

ඉහත 4 ඡේදයෙහි සඳහන් ඉංජිනේරු විද්‍යාව හැදෑරීම තුළින් ලබා ගත් දැනුම මත අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වය, විශ්ලේෂණ හැකියාව හා තීරණ ගැනීමේ හැකියාව විනිශ්චය කිරීම අරමුණු කරගෙන මෙම විභාගය ලකුණු 100කින් සමන්විත ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකට සීමා කරනු ලැබේ. විභාග ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වන අතර ඒ සඳහා පැය 1 1/2 ක කාලයක් ලබා දේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

8.2. සම්මුඛ පරීක්ෂණය

8.2.1. අයදුම්කරුවන් ලිඛිත විභාගයේ දී ලබාගන්නා ලකුණු අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

8.2.2. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කරයි.

8.2.3. මෙහි දී ලකුණු ලබාදෙනු නොලැබේ.

8.2.4. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂාව සිදු කරනු ලබයි.

8.2.5. අපේක්ෂකයකු විසින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී අදාළ සහතික හා ලේඛන ඉදිරිපත් කළ යුතු අතර එම සියලු ලේඛන / සහතික සෑම අතින්ම වලංගු ඒවා විය යුතුයි. නිසි බලධාරියාගේ ආවරණ අනුමැතියට යටත්ව ඉදිරිපත් කරනු ලබන කිසිදු ලේඛනයක් / සහතිකයක් වලංගු නොවේ.

8.2.6. අපේක්ෂකයන් කිහිප දෙනෙකු සමාන ලකුණු ලබා ඇත්නම් එවැනි අවස්ථාවල සුදුසු තීරණය ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන අතර එය අවසාන තීරණය වනු ඇත.

9. *විභාග කොන්දේසි* :

9.1. මෙම විභාගය සඳහා අයදුම් කිරීම අන්තර්ජාලය හරහා මාර්ගගත ක්‍රමයට (Online) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.slida.lk වෙත පිවිසීමෙන් පමණක් සිදු කළ හැක. වෙබ් අඩවියේ මුල් පිටුවේ දකුණුපස තීරුවේ "Examination" දිගුව ඔස්සේ "විභාග අංශය(Examination Division)" වෙත පිවිස තමාට අදාළ විභාගය තෝරාගැනීමෙන් විභාග අයදුම්පත සම්පූර්ණ කළ හැක.

9.2. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

9.3. විභාග ගාස්තුව රු.1,000.00 කි. විභාග ගාස්තුව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර දිවයින පුරා පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ පහත සඳහන් ගිණුමට මුදල් බැර කළ යුතුය. ගිණුම වෙත මුදල් බැර කිරීමේදී මුදල් තැන්පතු පත්‍රිකාවේ තැන්පත් කරන්නාගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය ඉදිරියේ අයදුම්කරුගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කළ යුතුය.

**සටහන** : මුදල් බැර කිරීමේ දී පහත තොරතුරු අදාළ මුදල් තැන්පතු පත්‍රිකාවේ (Cash Deposit Slip) ඇතුළත් කරන්න.

| | |
|---|---|
| ගිණුම් හිමියාගේ නම | : ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| ගිණුම් හිමියාගේ ලිපිනය | : නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 |
| ගිණුම් අංකය | : 7040712 |
| ශාඛාව | : නිදහස් චතුරශ්‍ර ශාඛාව |
| තැන්පත් කරන්නාගේ නම | : (අයදුම්කරුගේ නම ඇතුළත් කල යුතුය) |
| තැන්පත් කරන්නාගේ ජාතික හැඳුනුම්පත් අංකය | : (අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කළයුතුය) |

9.4. අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් ගැටළුවක් මතු වුවහොත් ඒ පිළිබඳව විමසීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 011-5980236 යන දුරකථන අංකය 2020.12.04 දින සිට 2021.01.04 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පැය 08:30 සිට පැය 16:15 දක්වා විවෘතව ඇත.

9.5. ඉතා වැදගත් :

අයදුම්පත නිසි පරිදි මාර්ගගත ක්‍රමයට (Online) සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වෙබ් පිටුවේ දෙනු ලබන උපදෙස් අනුගමනය කිරීමෙන් ඔබට හිමි විභාග අංකය හා විභාග ප්‍රවේශ පත්‍රය බාගත (Download) කරගත හැකිවනු ඇත. එම විභාග ප්‍රවේශ පත්‍රය තම අත්සන සහතික කිරීමෙන් අනතුරුව විභාග ශාලාවේ දී අනන්‍යතා පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු හෙයින් ප්‍රවේසම් කර තබා ගන්නාමෙන් අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ.වෙනත් කිසිදු ප්‍රවේශපත්‍රයක් තැපැලෙන් නොඑවන බව සලකන්න.

9.6 එම ප්‍රවේශ පත්‍රය මුද්‍රණය කර රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා ලවා ද එසේ නොවන අයදුම්කරුවන් රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන

මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ ලවා විභාග ප්‍රවේශ පත්‍රයෙහි තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ.

9.7 විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

9.8 විභාගය කොළඹ දී පවත්වනු ලබන අතර විභාග දිනය හා ස්ථානය ඔබ විසින් අයදුම්පතෙහි සඳහන් කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් දැනුම් දෙනු ලැබේ.

9.9 ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

**සැලකිය යුතුයි** : අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

9.10 තවද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් විභාග ගාස්තු ගෙවීමෙන් ලද මුදල් තැන්පතු පත (Cash Deposit Slip) සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ විභාග අපේක්ෂකත්වය අත්හිටවනු ලැබේ.

9.11 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය පැවැත්වීම, විභාගය කල්දැමීම හෝ අවලංගු කිරීමේ බලය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

9.12 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

9.13 විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු රියැදුරු බලපත්‍රය

කිසියම් අපේක්ෂකයකුගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ඉහත ලේඛනවල ඡායාරූපය සමග සම්පූර්ණ මුහුණ පරීක්ෂා කර බැලීමට විභාග බලධාරීන්හට බලය ඇති අතර, එවැනි පරීක්ෂා කිරීමක් ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

10. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :

යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු /ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. එලෙසම ඒ වන විටත් ඔහුට/ ඇයට වැටුප් හා වෙනත් දීමනා ලෙස රජය විසින් ගෙවා ඇති සියලු මුදල් ඔහුගෙන් /ඇයගෙන් ආපසු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ප්‍රථිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු, ලිඛිත විභාගයෙන් ලබා ගත් ලකුණු සඳහන් කර ප්‍රථිඵල සටහනක්, විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත යැවීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පියවර ගනු ඇත.

13. මෙම රෙගුලාසිවලින් ආවරණය නොවන කිසියම් කරුණක් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ.ජේ.රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත්
පාලන අමාත්‍යාංශය.

2020 නොවැම්බර් මස 30 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

12-229

රජයේ නිවේදනය සංශෝධනය කිරීම

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - (2020)**

''ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,194 හා 2020.09.18 දිනැති *ගැසට්* පත්‍රයෙන් ප්‍රසිද්ධියට පත්කර ඇති ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2020 බඳවා ගැනීමේ නිවේදනය සඳහා පහත සංශෝධනයන් ඇතුළත් කරනු ලැබේ.

(අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2020.12.31 වැනි දින වේ.

7(ii) අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

7(iv). අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සියලු සුදුසුකම් සහ කොන්දේසි සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

දැනටමත් අයදුම්කර ඇති අයදුම්කරුවන් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2020 දෙසැම්බර් මස 01 වැනි දින.

12-277

---

රජයේ නිවේදනය සංශෝධනය කිරීම

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019 (2020)**

''ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,194 හා 2020.09.18 දිනැති *ගැසට්* පත්‍රයෙන් ප්‍රසිද්ධියට පත්කර ඇති ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - (2019)2020 බඳවා ගැනීමේ නිවේදනය සඳහා පහත සංශෝධනයන් ඇතුළත් කරනු ලැබේ.

(අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2020.12.31 වැනි දින වේ.

8(iii) අයදුම්කරුවන් 2020.10.19 දිනට උපරිම වයස් සීමාව ඉක්මවා නොමැති විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට මෙම නිවේදනයේ සඳහන් සෙසු සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

දැනටමත් අයදුම්කර ඇති අයදුම්කරුවන් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2020 දෙසැම්බර් මස 01 වැනි දින.

12-276

සංශෝධනයයි

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2018 (2020))**

අංක 2194 දරන 2020 සැප්තැම්බර් මස 18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට පත්‍රයේ පළ කරන ලද "ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනිමේ සීමිත කරග විභාගය - 2018 (2020)" විභාග නිවේදනයේ, 4. අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද ඡේදයෙහි 4.1 පළපුරුද්ද කොටසෙහි (1) කොටස සහ 4.1 හ 2(අ) කොටස පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

4.1 පළපුරුද්ද :

(1) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ I ශ්‍රේණියේ නිලධරයෙකු වීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේක අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

හෝ

(2) (අ) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ වස 05ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති 2 පන්තියේ II ශ්‍රේණියේ නිලධරයෙකු වීම හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූළ දඬුවමක් ලබා නොතිබීම.

* එම ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වෙන අතර මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2020.12.31 තෙක් දීර්ඝ කරනු ලැබේ.

* මේවනවිටත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවන බව නිවේදනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,

2020 දෙසැම්බර්මස 02 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

12 - 336

---

සංශෝධනයයි

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 (2020))**

අංක 2194 දරන 2020 සැප්තැම්බර් මස 18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද "ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 (2020)" විභාග නිවේදනයේ අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය දීර්ඝ කරනු ලබන අතර එම නිවේදනයේ, 7. වෙනත් සුදුසුකම් ඡේදයෙහි (iii) කොටස ද පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

මෙම විභාගයේ අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2020.12.31 තෙක් දීර්ඝ කරනු ලැබේ.

7. වෙනත් සුදුසුකම් ඃ

(iii) අයදුම්කරුවන් 2020.10.26 වැනි දිනට උපරිම වයස් සීමාව ඉක්මවා නොමැති විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට මෙම නිවේදනයේ සඳහන් සෙසු සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

* එම නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වේ. මේවනවිටත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවන බව ද නිවේදනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,

2020 දෙසැම්බර් මස 02 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

12 - 335

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2020 වර්ෂය** | | | |
| දෙසැම්බර් | 2020.12.04 | සිකුරාදා | 2020.11.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.12.11 | සිකුරාදා | 2020.11.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.12.18 | සිකුරාදා | 2020.12.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.12.24 | බ්‍රහස්පතින්දා | 2020.12.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2021 වර්ෂය** | | | |
| ජනවාරි | 2021.01.01 | සිකුරාදා | 2020.12.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.01.08 | සිකුරාදා | 2020.12.24 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.01.15 | සිකුරාදා | 2021.01.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.01.22 | සිකුරාදා | 2021.01.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.01.29 | සිකුරාදා | 2021.01.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2021.02.05 | සිකුරාදා | 2021.01.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.12 | සිකුරාදා | 2021.01.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.19 | සිකුරාදා | 2021.02.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.25 | බ්‍රහස්පතින්දා | 2021.02.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.